# හද රිදවන මතක සුවඳ සහ අන්ධ භක්තිය - 6



මාරසිංහ සහෝදරයා

රෝහිත මුණසිංහ සහෝදරයා විසින් නොනිල මට්ටමෙන් කෙරුණු "අභ්‍යන්තර ඕපාදූප" මාලාවක් පදනම් කොට ගනිමින් පල කොට තිබෙන 'හද රිදවන මතක සුවඳ' නමැති ප්‍රකාශණයෙහි දක්වා තිබෙන වැරදි සහගත කරුණු කිහිපයක් ගැන සාකච්ඡා කිරීමයි මෙම ලිපි පෙලින් මා අරමුණු කර ගත්තේ.

රෝහණ විජේවීර සහෝදරයාත් මොරින් සහෝදරියත් අතර පැවතුනු සම්බන්ධතාවය ගැන පරීක්ෂණයක් පවත්වන්නට ප්‍රධාන ලේකම් වරයා වශයෙන් මා වෙත පවරන ලද්දේ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලය විසින් ය. දේශපාලන මණ්ඩලයට එසේ තීරණය කරන්නට කරුණු දෙකක් බල පා තිබුනි. ඉන් පළමු වැනි කරුණ වූයේ මොරින් සහෝදරිය විසින් එවැනි පරීක්ෂණයක් පවත්වන ලෙස පක්ෂයෙන් ඉල්ලා සිටීමයි. දෙවැනි කරුණ වූයේ මගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන පරීක්ෂණයකින් පසුව ගන්නා තීරණ රෝහණ සහෝදරයා පිලි ගනු ඇතැයි දේශපාලන මණ්ඩලයට තිබුනු විශ්වාස යයි. එවැනි පරීක්ෂණයකින් පසුව ගනු ලබන තීරණ පිලි ගැනීම රෝහණ සහෝදරයා විසින් ප්‍රතික්ෂේප කරන ලද්දේ නම් ඉන් පක්ෂයට ඇති විය හැකිව තිබුනු හානි කර දේශපාලන බල පෑම ගැනද දේශපාලන මණ්ඩලයේ අවධානය යොමු වී තිබිණ.

පරීක්ෂණය සඳහා කරුණු ඉදිරිපත් කල අය අතර රෝහණ විජේවීර සහෝදරයාත් මොරින් සහෝදරියත් පුත්තලම් දිස්ත්‍රික්කයේ ලේකම් සහ හලාවත ආසනයේ ලේකම් සහෝදර වරුත් සිටියහ. පරීක්ෂණය වෙත ඉදිරිපත් කරන ලද කරුණු සම්පිණ්ඩණය කිරීමෙන් සනාථ වූයේ මෙම සම්බන්ධතාවය රෝහණ සහෝදරයාත් මොරින් සහෝදරියත් යන දෙදෙනාගේම අවශ්‍යතා මත ආරම්භ කොට පවත්වා ගෙන ගොස් තිබුන බවය. එහෙත් ජනතා විමුක්ති පෙරමුණේ නායකයා ලෙස රෝහණ සහෝදරයා මෙම සම්බන්ධතාවය ආරම්භ කිරීමේදී සහ පවත්වා ගෙන යෑමේදී වඩා වැරදි සහගත ලෙස ක්‍රියා කර තිබුන බවත්, ඔහු මේ සම්බන්ධයෙන් වැඩි වගකීම ක් දැරිය යුතු බවත් නිගමනය කල ප්‍රධාන ලේකම් වරයා මෙම සම්බන්ධතාවය වහාම නතර කිරීමට කටයුතු කිරීම සුදුසු බව දේශපාලන මණ්ඩලය වෙත නිර්දේශ කලේය. එසේම මොරින් සහෝදරියගේ සහ ඇගේ සැමියාගේ තීරණය අනුව ඔවුන්ට නැවත පක්ෂයේ දේශපාලන වැඩ කටයුතු කරන්නට හෝ නොකරන්නට ඉඩ හරින ලෙස ද, අනවශ්‍ය ප්‍රසිද්ධියක් ලබා නොදී මෙම තීරණය ක්‍රියාත්මක කරන ලෙස ද නිර්දේශ කෙරින. රෝහණ සහෝදරයාත්, දේශපාලන මණ්ඩලයත් විසින් මෙම නිර්දේශ මුළු මණින් ම පිලි ගන්නා ලදහ.

එහෙත් මොරින් සහෝදරියට සහ ඇගේ සැමියාට පුත්තලම් දිස්ත්‍රික්කය තුල දේශපාලන වැඩ කටයුතු කරන්නට තරම් සුදුසු පරිසරයක් පැවතුනේ නැත. මොරින් සහෝදරිය යනු "පක්ෂයේ රහස් දැන ගැනීමට, පක්ෂයේ නායකයන් බිලී බා ගැනීමට, රෝහණ සහෝදරයාට වසදී ඝාතනය කරන්නට හතුරන් විසින් යොදවන ලද ඔත්තු කාරියක්" ය යන කථාවත්, රෝහණ සහෝදරයාට මුහුණ සෝදා ගැනීමට තබන ලද වතුර බේසමෙන් දිය බිව් පොල් කිච්චෙක් එතැනම මැරී වැටුණු කථාවත් සාමාජිකත්වය තුල පතුරවා හැර තිබුනු වාතාවරණයක් තුල එම දිස්ත්‍රික්කයෙහි එසේ දේශපාලන වැඩ කටයුතු කරන්නට මොරින් සහෝදරියට සහ ඇගේ සැමියාට ඉඩ නොලැබීම පුදුමයට කාරණයක් ද නොවේ. මට මතක අන්දමට වෙනත් දිස්ත්‍රික්කයක් තුල දේශපාලන වැඩ කටයුතු කරන්නට තරම් තත්වයක් ද ඔවුන්ට තිබුනේ නැත. ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන ඉතිහාසය සාකච්ඡා කිරීමේ දී මොරීන් පවුල වෙනුවෙන් ද සාධාරණය ඉෂ්ඨ විය යුතුයයි මම කලින් පවසා සිටියේ ඒ නිසා ය.




මෙම ලිපි කිහිපයෙන් අදහස් කරන්නේ "ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධව සිට පසුව එයින් ඉවත් කරන ලද සහ ඉවත් වූ අය" අතරින් ජනතා විමුක්ති පෙරමුණේ ගමන් මගට මහත් ලෙස බලපෑම් කර ඇතැයි රෝහිත මුණසිංහ සහෝදරයා විශ්වාස කරන්නේ යයි කියන කාන්තාවන් තිදෙනෙකු ගැන ඔහු විසින් ඉදිරිපත් කොට තිබෙන සාවද්‍ය කරුණු සමහරක් පිළිබඳව මා දන්නා කරුණු සාකච්ඡා කිරීමයි. මුණසිංහ සහෝදරයා විසින් චෝදනාවට ලක් කොට තිබෙන අනෙක් අය ගැන සාකච්ඡා කරන්නට පෙර, මේ අවස්ථාවේ දී මෙම සාකච්ඡාවේ සංදර්භය ගැන ද කරුණු කිහිපයක් පැවසිය යුතු ව ඇත. එසේ කිරීම මේ දේවල් ගැන වඩා විෂයමූලික ලෙසත් වැදගත් ලෙසත් සාකච්ඡා කරන්නට හේතු කාරක වෙනු ඇතැයි මම විශ්වාස කරමි.

සුළු මොහොතකට මෙම මාතෘකාවෙන් ඉවත් වී 'විමුක්ති ගී' ප්‍රසංගයේ විකාශණය ගැන කරුණු කිහිපයක් පැහැදිලි කිරීමට අවසර දෙන්න. 1978 දී ලාංකීය ගීත කලා ක්ෂේත්‍රයේ දේශපාලන පෙරලියක් ඇති කරමින් සමාජවාදී කලා සංගමය විසින් කරලියට ගෙන එන ලද 'විමුක්ති ගී' ප්‍රසංගයෙහි ආරම්භය 1969-70 කාලය දක්වා දිව යන්නේ යයි මම විශ්වාස කරන්නෙමි.

ඒ කාලයේ 'ලොකු මහත්තයා' (පසු කාලයේ රෝහණ සහෝදරයා) සහ 'ලොකු අතුල මහත්තයා' දේශපාලන වැඩ කටයුතු කිරීම සඳහා පේරාදෙනිය විශ්ව විද්‍යාලයට පැමිණි අවස්ථාවල දී අප බොහෝ දෙනෙක් ඔවුන් සමග විශ්ව විද්‍යාලයේ සිටි කිසියම් සහෝදරයෙකුගේ කාමරයකට එකතු වී සිංහල හෝ හින්දි ගීත කිහිපයක් ගයා සතුටක් ලබන්නට අමතක කලේ නැත. රෝහණ සහෝදරයාට ගී ගයන්නට එතරම් විශේෂ හැකියාවක් නොතිබුනත්, ඔහු කැමති ගීත ගායනා කරන ලෙස අනෙක් අයගෙන් ඉල්ලමින් ද, ගීත ගයන විට අත්පුඩි ගසමින් අනෙක් අය හා සමග එක් වීමෙන් ද විනෝද වෙන්නට ඔහු ප්‍රිය කලේය. 1970 දී අත් අඩංගුවට ගෙන බදුල්ල රක්ෂිත බන්ධනාගාරයේ රඳවා සිටි රෝහණ සහෝදරයා ට එරෙහිව පවරා තිබුන නඩුව විභාග යට ගන්නා ලද්දේ නුවරඑළියේ අධිකරණයේ ය. රෝහණ සහෝදරයා වෙනුවෙන් අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කරන ලද්දේ ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රබලයන් ව සිටි අධිනීතිඥ ආනන්ද ප්‍රේමසිංහ සහ මාර්ෂල් පෙරේරා යන සහෝදරවරුන් ය.

රෝහණ සහෝදරයා ට එරෙහිව නඩුව විභාගයට ගන්නා ලද දින වලදී ඔහුට සහයෝගය පල කර සිටින්නට ඒ කාලයේ 'ව්‍යාපාරයේ' (පසු කාලීනව ජනතා විමුක්ති පෙරමුණේ) සිටි සාමාජික සාමාජිකාවන් සහ හිතවතුන් හිතවතියන් දිවයිනේ නොයෙක් ප්‍රදේශවලින් නුවරඑළියේ අධිකරණය වෙත ගමන් කළහ. බොහෝ විට අප එහි ළගා වූයේ දුම්රියෙන් නානුඔය වෙත පැමිණ එතැන් සිට කිලෝ මීටර හයක් පමණ වූ දුර ඇවිද යාමෙනි. අප සාමාජික සාමාජිකාවන් සහ හිතවතුන් හිතවතියන් දුම්රියෙන් සහ පා ගමණින් නුවරඑළි එන විටත්, ආපසු යන විටත්, රතු කොඩි සහ සටන් පාඨ පුවරු ඔසවා ගෙන යන්නටද, සටන් පාඨ කියන්නටද අමතක නොකළහ.

අප සියළු දෙනා මෙම ගමනේ දී ගිමන් නිවා ගත්තේ බොහෝ විට දේශාභිමානී ගීත ගායනා කිරීමෙනි. ඉහත සඳහන් කල ආකාරයට ගීත ගායනා කරන ලද අවස්ථා වලදී ඇතැම් ජාති'ප්‍රේමී' ගීත දේශාභිමානී ගීත බවට හරවා ගත් ආකාරයත්, 1971 අප්‍රේල් නැගී සිටීමෙන් පසු කාලයේ දී සටන් බිම් වල සහ බන්ධනාගාර තුල 'විමුක්ති ගී' විකාශණය වූ ආකාරයත් ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.

ලයනල් බෝපගේ

